[redacted]


"நிர்வாகத்திறன் மிக்க மனிதவள முகாமைத்துவ முன்னோடி"

"Leader in effective Human Resource Management"

ඌව පළාත් සභාව

ஊவா மாகாண சபை

Uva Provincial Council

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) காரியாலயம்

OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (PERSONNEL & TRAINING)

රජ වීදිය, බදුල්ල — கிங்ஸ் வீதி, பதுளை — King's Street, Badulla.


ඔබේ අංකය / உமது இல. / Your No. }

මගේ අංකය / எனது இல. / My No. } 4/HRM/6 වා.ස්.මා. 01/ 2017

දිනය / திகதி / Date } 2017.03. 16

ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්,

ඌව පළාතේ පළාත් සභාවේ සියලුම

අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

ඌව පළාතේ පළාත් සභාවේ ලේකම්,

ඌව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

ඌව පළාතේ සමූපකාර කොමිෂන් සභාවේ ලේකම්.

## ඌව පළාත් රාජ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2017

ඌව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි සේවයේ, කළමනාකරණ සහකාර සේවයේ, රියදුරු සේවයේ හා කාර්යාල කාර්ය සහායක සේවයේ තනතුරුවල 2017 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කරන ලද මාගේ ඉහත සමාංක දරණ 2017.02.16 දිනැති ලිපිය හා බැඳේ.

02. යථොක්ත ලිපියෙන් ඉහත සේවාවන් වලට අදාළ ස්ථාන මාරු නියෝග 2017.04.05 දින සිට ක්‍රියාත්මක බවත්, එම ස්ථාන මාරු සම්බන්ධයෙන් කරනු ලබන අභියාචනා සලකා බලා අභියාචනා මණ්ඩල තීරණ 2017.03.20 දිනට පෙර දැනුම් දෙනු ලබන බවත් සඳහන් කරන ලදි.

03. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළු හා වෘත්තීය සමිති මගින් පෙන්වා දෙන ලද කරුණු පදනම්කරගෙන, ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.03.14 දින පැවති සාකච්ඡාවේදී ගනු ලැබුණු තීරණ ද ක්‍රියාත්මක කිරීම සඳහා අභියාචනා මණ්ඩල කටයුතු දින කිහිපයකින් ප්‍රමාද කිරීමට සිදුවන බැවින් වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක දිනය දින කිහිපයකින් කල් දැමීමට සිදුව ඇත. එම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක දිනය ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටින අතර මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන සියල්ල දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

බී.එම්.එල්. බණ්ඩාරනායක

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු)